තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය.

**ඒ. එම්. සුනිල් බංඩාර එ. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - කහටගස්දිගිලිය.**

RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය) 618/2021 - 2022.01.04 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති** : විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න
**කොමිෂන් සභා සාමාජික** : ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික** : විශ්‍රාමික විනිසුරු රෝහිණී වල්ගම
**කොමිෂන් සභා සාමාජික** : ජොෂ්ඨ නීතිඥ ජගත් ලියන ආරච්චි

**අභියාචක** - ඒ. එම්. සුනිල් බංඩාර
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - කහටගස්දිගිලිය.

**පෙනීසිටීම**
මෙය පාර්ශ්වයන්ගේ ලිඛිත කරුණු දැක්වීම් මත පදනම්ව විභාග විය.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2020.01.06 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2020.01.09, 2020.03.04. |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2020.02.05 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාර දක්වා නොමැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2020.08.12 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2020.01.06 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය.

1. *2018/06/01 දින 217 තුලානේ පැවති ඉඩම් කච්චේරියේ ප්‍රා:ලේ:තුමා අනුමත කල හා පලාත්:ඉ:කො:තුමා අනුමත කල ඉඩම් ලබාදීමේ ලැයිස්තුවේ පිටපත්*

2. *2017/02/14 දින ඉදිරිපත් කල වෛද්‍ය වාර්තාවේ පිටපතක්, ඉල්ලීම් ලිපියේ ප්‍රාදේශීය ලේකම්තුමා අනුමත කර ඇති ලිපියේ පිටපත හා සමාජ සේවා ආයතනයේ ලබාදුන් අයදුම්පතෙහි සම්පූර්ණ කරන ලද පිටපතක් ලබා ගැනීම*

තොරතුරු නිළධාරියා විසින් 2020.01.09 දින ලබා දුන් පහත පිළිතුරෙන් අතෘප්තියට පත් අභියාචක 2020.02.05 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකරන ලදි.

*02. "ඔබ විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව මා වෙතින් ඉල්ලා ඇති තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලද අතර, ඒ අනුව අවශ්‍ය තොරතුරු පිටු 05 ක ඇතුලත්ව ඇත.*

*03. එම තොරතුරු වලට අදාලව මුද්‍රිත පිටපත් ලබාදීමේදී A4 ප්‍රමාණයේ කඩදාසියක එක් පැත්තක තොරතුරු සඳහා රුපියල් හතරක (තනි පැත්තේ පිටුවකට රු.4.00) මුදලක් වනසේ පිටු 05 කට රුපියල් 20.00 ක මුදලක් ගෙවිය යුතුව ඇත. එම මුදල කාර්යාලයට පැමිණ ගෙවීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටින අතර, ඒ අනුව අදාල ගෙවීම් කටයුතු සිදු කිරීමෙන් අනතුරුව මෙම තොරතුරු කඩිනමින් ඔබ වෙත සැපයිය හැකි බව ද දන්වා සිටිමි."*

කෙසේවූවද, නම්කළ නිලධාරියා පනතේ නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් පත් අභියාචක විසින් 2020.08.12 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

ඒ අනුව, කොමිෂන් සභාව විසින් 2020.10 13 දිනැතිව එම අභියාචනය සම්බන්ධයෙන් දැනුවත් කරමින් පොදු අධිකාරිය වෙත පූර්ව දැනුම්දීමේ ලිපියක් යොමු කර ඇති අතර පොදු අධිකාරිය විසින් එකී ලිපියට 2020.10.23 දින ප්‍රතිචාර දක්වා ඇත**.**

තවද, තොරතුරු නිළධාරියා විසින් 2020.03.04 *දින "ඔබ විසින් ඉල්ලා ඇති ලිපියේ ඡායා පිටපත් මේ සමග ඉදිරිපත් කරන බව දන්වා සිටිමි."* ලෙස ද ප්‍රතිචාර දක්වා ඇත.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

මෙහිදී කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටිනුයේ නම්කළ නිළධාරියා ද පනතේ 31(2) වගන්තිය අනුව එනම් " නම්කළ නිලධරයා විසින් ඕනෑම අවස්ථාවකදී එසේ වූවත් වැඩකරන දින තුනක කාලයක් ඇතුළත අභියාචනය කරනු ලබන පුරවැසියා වෙත එම අභියාචනය භාර ගැනීමේ දී කුවිතාන්සියක් නිකුත් කළ යුතුය" හා 31(3) වගන්තියේ සඳහන් පරිදි "නම්කළ නිලධාරියා විසින් (1) වන උප වගන්තිය යටතේ සඳහන් කර ඇති යම් අභියාචනයක් පිළිබඳ තීරණය එම අභියාචනය ලැබී

සති තුනක කාලයක් ඇතුළත ලබාදිය යුතු අතර ඒ සඳහා නිශ්චිත පදනම ඇතුළුව එම තීරණය සඳහා වූ හේතු දැක්විය යුතුය" යන සිය ව්‍යවස්ථාපිත වගකීම ඉටුකර නොමැති බව නිරීක්ෂණය කර සිටී.

පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවේ පූර්ව දැනුම්දීමට ප්‍රතිචාර වශයෙන් 2020.10.23 වන දිනැතිව එවා ඇති ලිපිය අනුව, අභියාචකගේ තොරතුරු ඉල්ලීම් වලට අදාළව තොරතුරු අභියාචක විසින් 2020.01.13 දින සහ 2020.03.04 වන දින මුදල් ගෙවීමෙන් අනතුරුව අභියාචක වෙත ලබා දී ඇති බවට පොදු අධිකාරිය විසින් පවසා ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

කෙසේවුවද, කොමිෂන් සභා කාර්යාලය මඟින් 2021.12.30 වන දින අභියාචක දුරකථනයෙන් සම්බන්ධ කරගත් අවස්ථාවේදී තමන්ට තොරතුරු ඉල්ලීමට අදාළව අනෙකුත් තොරතුරු ලැබුණ නමුත් ඔහු විසින් තොරතුරු අයිතම දෙක (02) යටතේ ඉල්ලා ඇති, 2017/02/14 දින ලබාගත් සහ 2017.03.01 දින සහකාර සමාජසේවා නිළධාරිනි හට ඉදිරිපත් කළ, අභියාචක පූර්ණ අබාධිත තැනැත්තෙකු බව සඳහන් වෛද්‍ය වාර්තාවේ පිටපතක් තමන් වෙත මෙතෙක් ලැබී නොමැති බවට සඳහන් කර ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

ඒ අනුව, එම වෛද්‍ය වාර්තාව එම පුද්ගලයා අබාධිත බවට දක්වන ඔහුගේ වෛද්‍ය වාර්තාව බව කොමිෂන් සභාව විසින් වැඩිදුරටත් නිරීක්ෂණය කර සිටී.

**නියෝගය:**

ඒ අනුව, අභියාචකගේ තොරතුරු ඉල්ලීමට අදාළව අභියාචක පූර්ණ අබාධිත තැනැත්තෙකු බව සඳහන් වෛද්‍ය වාර්තාවේ පිටපතක් මෙම නියෝගය ලැබීමෙන් සති දෙකක කාලයක් තුළ කොමිෂන් සභාවට ද ආවරණ ලිපියේ පිටපතක් සහිතව අභියාචක වෙත ලබා දෙන මෙන් පොදු අධිකාරිය වෙත මින් නියෝග කෙරේ.

එසේම, අදාළ තොරතුරු ලැබීමෙන් අනතුරුව එකී තොරතුරු පිළිබඳව සෑහීමකට පත් වන්නේ ද යන්න සම්බන්ධයෙන් මෙම නියෝගය ලැබුණු දින සිට මාසයක් ඇතුළත කොමිෂන් සභාවට දැන්වීමට අභියාචක වෙත නියෝග කරනු ලබන අතර ඊට යටත්ව මෙම අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

ඒ අනුව, මෙම අභියාචනා විභාගය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.